# සමෘද්ධි

## දිළිඳුකම පිටුදැකීමේ
## ජාතික වැඩසටහන























මෙහෙයුම් හා ඇගයුම් අංශය,
**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

# සමෘද්ධි

## දිළිඳුකම පිටුදැකීමේ ජාතික වැඩසටහන

මෙහෙයුම් හා ඇගයුම් අංශය

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

හතරවන මහල,

සෙත්සිරිපාය,

බත්තරමුල්ල.

- **උපදේශක මණ්ඩලය**

  ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක
  ලේකම්
  සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

  පී. මාද්දුගොඩ
  අතිරේක ලේකම්
  සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

  ඩබ්.පී. මිත්‍රරත්න
  අධ්‍යක්ෂ ජනරාල්
  ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

  ආචාර්ය කුමාරි නවරත්න
  කොමසාරිස් ජනරාල්
  සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

  පී.කේ. ගුණවර්ධන
  දිළිඳු සහන කොමසාරිස්
  දිළිඳු සහන දෙපාර්තමේන්තුව

  එල්මෝ ගුණරත්න
  මාධ්‍ය උපදේශක
  සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

- **සංස්කාරක**
  ඩී.එල් කුමාරදාස
  අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්)
  ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

- **සම්බන්ධීකරණ කටයුතු**
  ජේ.ඒ.කේ.එන්. ජයතුංග
  නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්)
  ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

- **පිටු සැලසුම් කිරීම සහ කවර නිර්මාණය**
  අජිත් හුණුකුඹුර — සමෘද්ධි කළමණාකරු

- **තොරතුරු සම්පාදනය හා රචනය**
  රසිකා විජේසූරිය — සමෘද්ධි කළමණාකරු
  රංජලා කෝදාගොඩ — සමෘද්ධි කළමණාකරු
  නිල්මානි තෙන්නකෝන් — සමෘද්ධි කළමණාකරු
  සුරම්‍යා ද සිල්වා — සමෘද්ධි කළමණාකරු
  සුධර්මා පෙරේරා — සමෘද්ධි කළමණාකරු
  පියල් රේණුක — සමෘද්ධි කළමණාකරු
  ජානකී ගුණවර්ධන — සමෘද්ධි කළමණාකරු

- **වදන් සැකසුම**
  බිනා කන්දේගෙදර
  ජානකී නිලවතුර
  චිත්‍රලේඛා සමරනායක

- **ඡායාරූප**
  කලාප කළමණාකරුවන්
  හේමජිත් ප්‍රනාන්දු
  තිලක් වික්‍රමාරච්චි

- **බෙදාහැරීම**
  බෙනඩික් සමරසිංහ — සමෘද්ධි කළමණාකරු
  ගිරාණි කහඳගේ — සමෘද්ධි කළමණාකරු
  අමිතා කුමාරි — සමෘද්ධි කළමණාකරු
  එච්.එන්. පියසිරි — ප්‍රධාන ලිපිකරු

- **මුද්‍රණය :**
  1999 ඔක්තෝබර්
  තරුණ සේවා මුද්‍රණාලය
  ජාතික තරුණ මධ්‍යස්ථානය
  මහරගම.



## ගරු සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමාගේ සුබපැතුම් පණිවුඩය

දිළිඳුකම පිටුදැකීමේ ජාතික වැඩසටහන ලෙස ක්‍රියාත්මක වන සමෘද්ධි ව්‍යාපෘතියෙන් අප උත්සාහ කරන්නේ ශ්‍රී ලංකාවෙහි දිළිඳු ජනතාව සංවර්ධන මට්ටමකට ගෙන ඒම පමණක් නොව, තරුණ විරැකියාව පිළිබඳ ගැටළු ද යම් තරමක් දුරට හෝ විසඳීමය.

රටේ ජනගහන වර්ධන අනුපාතයට වැඩි වේගයකින් වර්ධනය වන ශ්‍රම බලකායට ගැලපෙන රැකියා අවස්ථා සහ ආදායම් උත්පාදන අවස්ථා සම්පාදනය කිරීම පිළිබඳ සමෘද්ධි ව්‍යාපාරය තුළින් විවිධ වැඩසටහන් දියත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් අපි සතුටු වෙමු. සමෘද්ධි වැඩසටහනෙහි ගම් මට්ටමේ නියමුවන් ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සමෘද්ධි සංවර්ධන ක්‍රියාදාමයට ක්‍රියාශීලි දායකත්වය සපයන සමෘද්ධි කළමණාකරුවන්ගෙන් ද අප බලාපොරොත්තු වනුයේ පොදු ග්‍රාමීය සංවර්ධන කටයුතු මෙන්ම දිළිඳු පවුල්වල ආර්ථික, සංස්කෘතික සහ සමාජයීය සංවර්ධන කාර්යභාරයන් ඉටු කිරීමේ මූලික වගකීම වේ.

සමෘද්ධි වැඩසටහනට අනුව දිළිඳුකම අවම කිරීමේ ප්‍රධාන උපාය මාර්ගය ලෙස අඩු ආදායම් ලබන පවුල් නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගි කර ගැනීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවලට අවශ්‍යවන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් උසස් කර ගැනීම සහ ස්වයං රැකියා ඇරඹීම සඳහා ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාකර ගැනීමට සුදුසු පහසුකම් වර්ධනය කිරීම ඉතා සාර්ථකව ඉටු කර ඇත්තෙමු. සහභාගීත්ව සංවර්ධන වැඩසටහනක් ලෙස සියළු තීරණ ගැනීමේ වගකීම ගම් මට්ටමට පැවරී ඇති අතර, ඒ සඳහා තරුණ සහභාගීත්වය ඇතිව ක්‍රියාත්මක වේ. සමෘද්ධි බැංකු 1000 ක් විවෘත කිරීමත් රු. දශලක්ෂ 838 ක පමණ මුදලක් ඉතිරි කිරීමත්, පවුල් 1,38,878 ක ප්‍රමාණයකට රුපියල් මිලියන 561 ක පමණ මුදලක් ණය වශයෙන් ලබා දීමත් ජයග්‍රාහී ඉලක්කයන් ලෙස සැලකිය හැකිය.

එපමණක් නොව, සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘතීන් ද පෝෂණ වැඩසටහන් ද සමෘද්ධි බැංකු තුළින් දී ඇති ණය මුදල්වලින් 98% ක් ආපසු අයකර ගැනීමට හැකිවී තිබීම ද, සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල යටතේ විශේෂ ආරක්ෂණ ව්‍යාපෘතීන් දිවයින පුරා සාර්ථකව ක්‍රියාත්මක කිරීම ද පිළිබඳව අපට සතුටු විය හැකිය. එපමණක් නොව, අඩු ආදායම් ලබන පවුල්වල දරුවන්ට අධ්‍යාපනය ලැබීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ද, ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන යටතේ දිවයින පුරා වැය කරන ලද මුදල් ප්‍රමාණයට වඩා වැඩි අගයකින් යුත් විවිධ ව්‍යාපෘතීන් රාශියක් ක්‍රියාත්මක කිරීමට ද හැකිවී තිබේ. දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී වැඩසටහන දිවයින පුරා සාර්ථකව දියත් කිරීමට හැකිවීම ද සමෘද්ධි ව්‍යාපෘතියෙහි සැලකිය යුතු පියවරක් ලෙස හැඳින්වීමට පුළුවන.

මෙම සියළු වැඩසටහන් අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මග පෙන්වීම යටතේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය ඇතිව ක්‍රියාත්මක වූ බව සඳහන් කරන අතර, අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්තුමාත්, සමෘද්ධි කොමසාරිස් ජනරාල්තුමියත්, දිළිඳු සහන කොමසාරිස්තුමිය ඇතුළු අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය මත ඉටු වූ බැවින්, ඒ සැම දෙනාමටම ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කොට ගනිමි.

එස්.බී. දිසානායක,
සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.



## ගරු සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය ජීවන් කුමාරණතුංග මැතිතුමාගේ පණිවුඩය

දිළිඳුකම පිටු දැකීමේ ජාතික වැඩසටහන ලෙස හැඳින්විය හැකි සමෘද්ධි වැඩසටහනෙහි සාර්ථක පුරෝගාමීන්ට සම්මාන පිරිනැමීම හා සමෘද්ධි වැඩසටහනට සම්බන්ධ සියළුම දෙනාගේ කාර්යයන් අගය කිරීම සඳහා පවත්වනු ලබන සමෘද්ධි උපහාර උත්සවය නිමිත්තෙන් මෙම පණිවුඩය නිකුත් කරනු ලබන්නේ සතුටෙනි.

මුළු ශ්‍රී ලංකාව පුරා එක ලෙස ක්‍රියාත්මක වන පුළුල් වැඩසටහනක් ලෙස පසුගිය කාලය මුළුල්ලෙහි විශාල ප්‍රගතියක් අත්කර ගෙන ඇති සමෘද්ධි ව්‍යාපෘතිය දිළිඳුකම අවම කිරීමේ ප්‍රමුඛ වැඩසටහනක් ලෙසින් පමණක් නොව සංස්කෘතික හා සමාජීය සංවර්ධන කාර්ය භාරයන් ඉටු කරන්නා වූ මෙන්ම සෞඛ්‍ය, අධ්‍යාපනික ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරමින් පුළුල් ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති ව්‍යාපෘතියක් බව ශ්‍රී ලංකාවේ ඕනෑම ගම්බද ප්‍රදේශයකදී පවා පැහැදිලිව දැකිය හැකිය.

අතිගරු ජනාධිපතිතුමියගේ මගපෙන්වීම යටතේ සහ ගරු සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය, එස්.බී. දිසානායක ඇමතිතුමාගේ පුරෝගාමීත්වය යටතේ ඉටු කෙරෙන්නා වූ මෙම වැඩසටහන සඳහා විශේෂ කාර්යයන් ඉටු කරනු ලබන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියළුම නිලධාරීන්ටත්, සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමෘද්ධි කොමසාරිස් ජනරාල්තුමියටත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තුමාටත්, සමෘද්ධි වැඩසටහනට සහායදෙන අනෙකුත් සියළුම නිලධාරීන්ටත්, ප්‍රාදේශීය මට්ටමේ දී මෙම වැඩසටහනට දායක වන සමෘද්ධි නියාමකවරුන් ඇතුළු සියළුම දෙනාටත්, ස්තුති කිරීමට කැමැත්තෙමි.

ජීවන් කුමාරණතුංග,
සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය.



## ගරු සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය, පියසේන ගමගේ මැතිතුමාගේ සුභපැතුම් පණිවුඩය.

සමෘද්ධි ක්‍රියාකාරි වැඩසටහනෙහි පුරෝගාමීන්ට සම්මාන පිරිනැමීමත්, වැඩසටහනට දායකත්වය සපයන සියළු දෙනාගේ සේවය අගය කිරීම සඳහාත් පවත්වනු ලබන උපහාර උළෙලෙහි ශ්‍රී ලංකාවේ සමෘද්ධි වැඩසටහන ලබා ඇති ප්‍රගතිය පිළිබඳව මගේ සතුට පිරිනමමි.

සමෘද්ධි ව්‍යාපෘතියට අනුව දිළිඳුකම අවම කිරීමේ වැඩසටහනක් ලෙසින් පමණක් නොව, අඩු ආදායම් ලබන පවුල් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීමත් සමෘද්ධි බැංකු 1000 ක් වැනි විශාල ප්‍රමාණයක් තුළින් දිළිඳු ජනතාව ඉතිරිකිරීම්වලට පොළඹවා ඒ මගින් විවිධ ව්‍යාපෘතීන් සඳහා ණය සහන සැපයීමේ ජයග්‍රාහී ඉලක්කයන් ද සපුරා ඇත.

එපමණක් නොව, ණය වැඩසටහන යටතේ දී ඇති ණයවලින් ඉතා වැඩි මුදලක් අයකර ගැනීමට හැකිවී තිබීම විශේෂයෙන් සැලකිය යුතු වන අතර, සත්ත්ව පාලන, ධීවර, පෝෂණ, සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි වැඩසටහන් ඔස්සේ විවිධ ක්ෂේත්‍රයන් කිහිපයක විහිදී යන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට ද හැකිවී තිබේ. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමියගේ උපදෙස් හා මග පෙන්වීමත්, ගරු එස්.බී. දිසනායක ඇමතිතුමාගේ ක්‍රියාශීලි නායකත්වයත් හේතු වූ බව මෙහිදී කිව යුතුය.

ශ්‍රී ලංකාව පුරා විහිදී යන දැවැන්ත වැඩසටහනක් වූ සමෘද්ධි වැඩසටහනෙහි සාර්ථකභාවයට ක්‍රියාශීලිව සහයෝගය දක්වන ලේකම්තුමා ඇතුළු සියළුම නිලධාරීන්ට ස්තුතිය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර, අද දින උපහාර ලබන සියළුම දෙනාට මෙම වැඩසටහන වඩාත් සාර්ථක කරගැනීමට වඩවඩාත් ධෛර්යය හා ශක්තිය ලැබේවා යි පතමි. සමෘද්ධි වැඩසටහනෙහි සාර්ථකභාවයට හේතුව ඒ හා ක්‍රියාශීලිවන සමෘද්ධි කළමණාකරුවන්, සමෘද්ධි නියාමකයින් වැනි තරුණ තරුණියන්ගේ දායකත්වය වන හෙයින්, ඒ හැම දෙනාටම ස්තුතිය පළ කිරීමට ද මෙය අවස්ථාවක් කොට ගනිමි.

පියසේන ගමගේ,
සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය.



# ලේකම්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් පසුගිය වසර කිහිපය තුළ කරන ලද වැඩසටහන් පිළිබඳව සංඛ්‍යාත්මක අත් පොතක් සකස් කිරීම අතිශය ප්‍රයෝජනවත් කටයුත්තක් සේ සලකමි. විශේෂයෙන් ව්‍යාපෘති ව්‍යාප්තිය, ඒවායේ ප්‍රයෝජන ලබන ජන කොටස්වල ප්‍රමාණය, වැඩසටහන මඟින් පොදුවේ දිළිඳුකම තුරන් කිරීම සඳහා කරනු ලබන විවිධාකාර ප්‍රවේශයන්ගේ ප්‍රගතිය, මෙම සංඛ්‍යාත්මක අත්පොතෙන් මනාව පැහැදිලි කර දී ඇත.

සමෘද්ධි වැඩසටහන සහනාධාර ලබාදීමේ වැඩසටහනකට වඩා ව්‍යාප්ත වූ වැඩසටහනක් බව මෙම පොතෙහි අන්තර්ගතයෙන් පැහැදිලිවම හඳුනාගත හැකිය. මෙම සමස්ථ වැඩසටහන ප්‍රජා සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, මූල්‍ය කළමණාකරනය සහ මූල්‍ය සංචිත ඇතිකිරීම වැනි විවිධ විෂයයන් ඒකරාශි කර සකස් කරන ලද්දකි. මෙයින් අපේක්ෂිත අවසාන ප්‍රතිඵලය නම්, සහනාධාරලාභීන් දිළිඳුකමින් ඉවත් කර වඩා ඵලදායි ජීවන රටාවකට චිරස්ථායි ලෙස පත්කිරීමය.

මෙම සංඛ්‍යාත්මක අත් පොතෙහි දැක්වෙන කරුණු සමෘද්ධි වැඩසටහන ඇගයීමකට ලක් කිරීමටත්, එම වැඩසටහනේ තීව්‍රතාවය හා විස්තීර්ණය පැහැදිලිව අවබෝධ කර ගැනිමටත්, එයින් දිළිඳු ජනතාවට ඇතිවන ප්‍රයෝජනය පිළිබඳව විමසීමක් කිරීමටත්, පර්යේෂකයන්ට සහ සාමාන්‍ය පාඨකයන්ට ඉමහත් ප්‍රයෝජනයක් ලබා දෙනු ඇත.

මෙම සංඛ්‍යාත්මක අත් පොත සකස් කිරීමට කටයුතු කළ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිලධාරීන්ට මාගේ ස්තුතිය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක

ලේකම්

සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය



## දිළිඳුකම පිටුදැකීමට ප්‍රජා සහභාගිත්වයෙන් ගොඩනැඟෙන බහුවිධ සංවර්ධන උත්සාහයක්

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙන දිළිඳුකම පිටුදැකීමේ ජාතික ව්‍යාපාරයේ ප්‍රගතිය දැක්වෙන මෙම වාර්තාව තුළින් එම ව්‍යාපාරයේ අන්තර්ගතව ඇති බහුවිධ සංවර්ධන ප්‍රවේශය මැනවින් විදහා දැක්වේ. මෙම ව්‍යාපාරයේ එක් ප්‍රබල ප්‍රවේශයක් වන්නේ ලංකාවේ අඩු ආදායම්ලාභීන් හා සමාජයේ අවාසිදායක කොටස්වලට සුභසාධන හා ආරක්ෂණ ජාලයක් ඇතිකිරීමයි. ලංකාවේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 52% ක් පමණ වූ පහල ආදායම් ස්ථරයේ සිටින පවුල්වලට වාර්ෂිකව රුපියල් කෝටි 900 කට ආසන්න සහනාධාර ලබාදීමක් සිදුවේ. ඒ සමඟම එම පවුල් සංඛ්‍යාවෙන් බහුතරයකට සමාජ ආරක්ෂණ ක්‍රමයක් මඟින් මරණය, විවාහය, දරු උපත හා රෝගී තත්ත්වයන්ට අදාලව වන්දි ගෙවීමක් කරනු ලැබේ. එමෙන්ම මෙම ප්‍රගති වාර්තාවේ දැක්වෙන කරුණු අතර ග්‍රාම සංවර්ධන ප්‍රවේශයක්ද දැක්වේ. ඒ යටතේ ග්‍රාමීය සමෘද්ධි බලකායන් මඟින් ප්‍රජාවට අවශ්‍ය යටිතල පහසුකම් හා කුඩා වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, එම ජන කාණ්ඩයේම සහභාගිත්වයෙන් සිදුකර ඇති ආකාරය දැක්වේ.

අවසාන වශයෙන් දිළිඳු ප්‍රජාව බලගැන්වීම සඳහා ඔවුන් සමාජ තල 04 ක සංවිධානගත කිරීමක්ද, ඉතිරිකිරීම් හා ණය පහසුකම් ළඟාකිරීම සඳහා දුප්පතුන්ගේ සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරයක්ද, මානව හා සමාජ සංවර්ධනය මුල්කරගත් සමෘද්ධි මහ සංගම් වැඩසටහනක්ද ගැන තොරතුරු හෙළිදරව් වේ. තවද මෙම ක්‍රියාවලියට සහාය වන මානව හා ආර්ථික සංවර්ධනය උදෙසා කෙරෙන කෘෂිකර්ම, සත්ත්වපාලන, අලෙවි හා වෘත්තිය පුහුණු වැඩසටහන් ගැන විස්තරද දැක්වේ.

දිළිඳුකම සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික ආදී කරුණු රාශියක් හා එකට බැඳී පවතින්නකි. මේ නිසා දිළිඳුකම පිටුදැකීමට බහුවිධ සංවර්ධන ප්‍රවේශයක් අවශ්‍ය වේ. එය අනිවාර්යයෙන්ම සුභ සාධන හා ආරක්ෂිත ජාලයක් යන සංකල්පයෙන්ද එහාට ගමන් කළයුතු ව්‍යාපාරයකි. දිළිඳු ජන කාණ්ඩයේ විභව ශක්තීන්, වෙළඳපොල ආර්ථික ක්‍රමය සාර්ථකව ග්‍රහණය කිරීමට හැකිවන සේ වර්ධනය කරන හා අවදිකරන ව්‍යාපාරයක් බවට එය පත්විය යුතුය.

සමෘද්ධි ව්‍යාපාරය තුළ එම දිළිඳු ප්‍රජාව ශක්ති වර්ධනයට හා අවදිකිරීමට අවශ්‍ය බහුවිධ සංවර්ධන ප්‍රවේශය ඇති අතර, ඒ පිළිබඳ කිසියම් අවබෝධයක් ලබා ගැනීමට මෙම ප්‍රකාශණය හේතු වේයැයි අවංකවම සිතමි.

ඩබ්.ජී. මිත්‍රරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

# ඇතුල් පිටු


| | | |
|---|---|---|
| | | පිටු අංකය |
| 1. පසුබිම | ........................................ | 01 |
| 2. සමෘද්ධි සහනාධාර වැඩසටහන | ........................................ | 05 |
| 3. ඉතිරිකිරීම් | ........................................ | 06 |
| 4. සමෘද්ධි බැංකු සංගම් | ........................................ | 09 |
| 5. ප්‍රජා ව්‍යාපෘති | ........................................ | 13 |
| 6. වෘත්තිය හා සුළු කර්මාන්ත සංවර්ධන වැඩසටහන | ........................................ | 16 |
| 7. සමාජ සංවර්ධන වැඩසටහන | ........................................ | 17 |
| 8. අලෙවි සංවර්ධන වැඩසටහන | ........................................ | 18 |
| 9. ශ්‍රම සූක්ෂම ව්‍යාපෘති වැඩසටහන | ........................................ | 22 |
| 10.කෘෂි සංවර්ධන වැඩසටහන් | ........................................ | 23 |
| 11.ණය වැඩසටහන් | ........................................ | 25 |
| 12.විශේෂ ව්‍යාපෘති සඳහා ණය ලබාදීම | ........................................ | 28 |
| 13.සත්ත්ව පාලන හා ධීවර වැඩසටහන | ........................................ | 29 |
| 14.මෙහෙයුම් හා ඇගයුම් කටයුතු | ........................................ | 31 |

# පසුබිම

උසස් සාක්ෂරතාව, දිගුකල් ජීවත්වීමේ හැකියාව, පහත් ළදරු මරණ අනුපාතිකය ආදී දර්ශක අනුව සසඳා බලන කල තෙවැනි ලොව අන් රටවල්වලට වඩා දියුණු තත්ත්වයක් පෙන්නුම් කළ ද, විරැකියාව හා දුප්පත්කම හේතු කොට ගෙන පැන නැගි ඇති බලවත් සමාජ අර්ථික ප්‍රශ්ණ රැසකට අප රට අද මුහුණ පා ඇත.

ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම පසුගිය දශකවල ක්‍රමයෙන් වැඩිවෙමින් පැවතුන ද ආදායම බෙදී යාමේ විෂමතාවයක් දක්නට ඇත. 1973 දී ජනගහනයෙන් 40% ක් වූ අඩු ආදායම් ලබන ජන කණ්ඩායම ලැබූ ආදායම් ප්‍රමාණය රටේ මුළු ආදායමෙන් 19.3% ක්ව තිබූ අතර 1991 දී එය 14.8% දක්වා පහත වැටී ඇත. රැකියා අවස්ථා වසරකට වැඩිවී ඇත්තේ 1.1% කින් පමණි. එහෙත් ශ්‍රම බලකාය ඊට දෙගුණයකින් වැඩිවී ඇත. ලක්ෂ 6 කට ආසන්න සංඛ්‍යාවක් දැනට රැකියා විරහිතව සිටින අතර එයින් 35% ක් ද්විතියික අධ්‍යාපනය නිම කළ උගත් තරුණ පිරිස වෙති.

ජීවත්වීම සඳහා වැදගත්වන මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ සහ සමාජ සාධාරණත්වය ලබාගැනීමේ අපහසුතාවය පෙන්නුම් කරන ලක්ෂණයක් හැටියට දුප්පත්කම දැක්විය හැක. උරුමයෙන් ලත් දෙයක් නොමැතිකමින් දුප්පත්ව සිටින අය ද තමන් උපයාගත් දේ ක්‍රමානුකූලව වියදම් නොකිරීම නිසා මහළුවියේදී දුප්පත්ව සිටින අය ද, අබාධිත හෙයින් සදාකාලිකව දුප්පත්ව සිටින අය ද වශයෙන් දුප්පතුන් කොටස් කළ හැක. මින් වැඩි දෙනෙකුට රැකියා අවස්ථා සපයා දීම තුළින් දුප්පත්කමින් මුදවා ගත හැක.

පෝෂණ තත්ත්වය පදනම් කොට ගත් මිනුමක් දුප්පත්කම මැනීම සඳහා යොදා ගනු ලැබේ. මන්දපෝෂණය හා දුප්පත්කම අතර බලවත් සහසම්බන්ධතාවයක් පවතින බව ලොව නොයෙක් රටවල කර ඇති සමීක්ෂණවලින් පෙනී ගොස් ඇත. මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් බොහෝ විට හමුවන්නේ දුප්පත් පවුල් අතරිනි. 1980 - 82 අතර පවත්වන ලද පෝෂණය පිළිබඳ සමීක්ෂණයකින් හෙළිවූ කරුණු අනුව අප රටේ පෙර පාසල් යන ළමුන් අතුරින් 36% ක් උග්‍ර මන්ද පෝෂණයෙන් පෙළුණහ. මේ හේතු කොට ගෙන ඔවුන්ගේ වර්ධනය ද බාල වී තිබුණි. වයස අනුව තිබිය යුතු බර ප්‍රමාණය අනුව සලකා බැලූ විට, 1993 දී පෝෂණ ප්‍රතිපත්ති සැලසුම් අංශය මගින් කරන ලද සමීක්ෂණයකට අනුව වයසට අඩු බරින් යුත් දරුවන්ගේ සංඛ්‍යාව 35% ක් පමණ වන බව පෙනී ගොස් ඇත.

රැකියා විරහිත, ඌණ සේවා නියුක්ත හා දුප්පත් යන කොටස් සමාජය තුළ පැහැදිලිව වෙන්කොට හඳුනා ගැනීම අපහසුය. රැකියා විරහිත බොහෝ අය දුප්පතුන් නොවෙති. එමෙන්ම රැකියා කරන අය අතර ද දුප්පතුන් සිටිති. රැකියා කරන සමහර අයට තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොමැත. මේ අනුව පෙනී







































යන්නේ ආන්තිකව අඩු නිෂ්පාදන ඵලදායිතාවයක් ඇති කටයුතුවල දුප්පතුන් යෙදී සිටින බවත්, අඩු ශ්‍රම ඵලදායිතාවතුළින් ලැබෙන සත්‍ය ඉපැයුම ක්‍රමයෙන් අඩුව ගොස් සමහර රැකියාවල යෙදෙන්නවුන් ද දුප්පතුන් ගණයට වැටෙන බවත්ය.

පවතින සංඛ්‍යා ලේඛණ අනුව පෙනී යන්නේ දුප්පත්කම වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ නාගරිකව නොව ග්‍රාමීයව බවය. නාගරික දුප්පතුන් බොහොමයක් ගමින් නගරයට පැමිණි අය වෙති. රැකියා සොයා ගමින් නගරයට එන්නෝ අඩු වැටුපක් ලබන රැකියාවල යෙදෙති. ඔවුන් නුපුහුණු ශ්‍රමිකයන්ය. බොහෝවිට ඔවුන්ගේ රැකියා තාවකාලිකය. අවිධිමත් ආර්ථික අංශයේ රැකියාවල යෙදී සිටීම පොදු ලක්‍ෂණයකි.

මෙම ප්‍රශ්ණයට විසඳුම් සෙවීම සඳහා වරින්වර රජය මගින් නොයෙකුත් උත්සාහයන් දරා ඇත. 1950 දශකයේ ඉදිරිපත් කළ දස අවුරුදු සැලැස්ම, 1970 දශකයේ ඉදිරිපත් කළ පස් අවුරුදු සැලැස්ම, 1980 දශකයේ ඉදිරිපත් කළ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හා එම දශකයේ අගභාගයේදී ඉදිරිපත් කළ ජනසවිය වැඩසටහන මේ සඳහා ගත් පියවර ලෙස දැක්විය හැක. මේ සියළු වැඩසටහන් මගින් රටේ ආර්ථික සංවර්ධනය වැඩිකරලීම තුළින් රැකියා අවස්ථා ජනනය කොට විරැකියාව හා දුප්පත්කම අවම කිරීම අපේක්‍ෂා කෙරිනි.

වැඩි ඵලදායිතාවයකින් යුත් රැකියා හා ආදායම් උත්පාදන අවස්ථා හඳුන්වාදීම, එකතු කරන ලද වැඩි වටිනාකමකින් යුත් නව නිෂ්පාදන අවස්ථා හඳුන්වාදීම, නව හා උපයෝගී තාක්‍ෂණය යොදා ගනිමින් නිෂ්පාදන කටයුතුවල යෙදීමට අවස්ථාව සපයාදීම හා වෙළඳපළට ප්‍රවේශවීමේ අවස්ථා හඳුන්වා දීම මේ සඳහා ගත හැකි සුදුසු පියවර ලෙස හඳුන්වා දිය හැකිය.

1994 දී නව රජය මගින් දුප්පත්කම තුරන් කරලීම සඳහා ඉදිරිපත් කරන ලද ජාතික වැඩසටහන වූයේ සමෘද්ධි වැඩසටහනයි. තරුණයන් අතර බලවත්ම ප්‍රශ්ණය වන විරැකියාවට විසඳුමක් ලබාදීමත්, පොදුවේ දුප්පත්කම රට තුළින් තුරන් කිරීමත්, තරුණයන් සංවර්ධනයට සෘජුවම සහභාගී කරවාගැනීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ.

සීඝ්‍රයෙන් වැඩිවන ශ්‍රම බලකාය සඳහා ඉහළ ඵලදායිතාවයකින් යුත් රැකියා අවස්ථා හා ආදායම් මාර්ග හඳුන්වා දීම එතරම් පහසු කටයුත්තක් නොවේ. එහෙත් ඊට අදාළ වන ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ග්‍රාමීය ජනතාව තුළ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය ඉහළ දැමීම හා ඔවුන් අතර ස්වයං රැකියා සඳහා ප්‍රවේශවීමේ අවස්ථා වැඩිකරලීම යන කටයුතු සඳහා මෙම වැඩසටහන මගින් ප්‍රමුඛත්වය ලබාදී ඇත.













## සමෘද්ධි වැඩසටහනේ පරිපාලන හා කළමණාකරණ අදියර

ජනතා සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේද භාවිතා කරමින් සමෘද්ධි වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා පහළ සිට ඉහළට නැංවෙන අදියර කිහිපයකින් යුත් සංවිධාන ජාලයක් පිහිටුවා ඇත.

## පස්දෙනාගේ කණ්ඩායම

ග්‍රාමීය මට්ටමේ පහළම සංවිධානය වන්නේ පස් දෙනාගේ කණ්ඩායමයි. තම තමන්ගේ කැමැත්ත මත දුප්පත් පවුල් පහක් එක්වී මෙම කණ්ඩායම සෑදේ. මෙම කණ්ඩායම සතිපතා රැස්වී සාකච්ජා පවත්වන අතර, සැලසුම් ක්‍රියාවලිය පවුල වෙත ගෙන යන ඉතා හොඳ වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක් ලෙස ද හැඳින්විය හැක.

## සමෘද්ධි බලකාය

සමෘද්ධි බලකාය ඇත්තේ ග්‍රාම නිළධාරී වසමකටය. අදාල වසමේ වයස 18 - 35 අතර තරුණ පිරිස මෙයට අයත්වේ. තරුණ තරුණියන් රටේ සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීමට මෙහෙයවීමට හා ප්‍රගති පාලනයට සම්බන්ධ කරගැනීම බලකායන් පිහිටුවීමේ මූලික අරමුණ වේ.

## උපදේශක සභා

බලකායට අයත් වසම්වල පදිංචි උගතුන් වැඩිහිටියන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩල පිහිටුවා ඇති අතර සමෘද්ධි බලකායට අවශ්‍ය උපදෙස් මෙමගින් ලබාදෙනු ලැබේ.

## ප්‍රාදේශීය සමෘද්ධි කමිටු

ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශකට එක බැගින් ප්‍රාදේශීය සමෘද්ධි කමිටු පිහිටුවා ඇත. සියළු ප්‍රාදේශීය රජයේ නිලධාරීන් එහි සාමාජිකයෝ වෙති. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ සියළුම වගකීම් මෙම කමිටුව වෙත පැවරී ඇත.

## දිස්ත්‍රික් සමෘද්ධි කමිටු

දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගෙන් මෙම කමිටු සමන්විත වේ. දිස්ත්‍රික්කයේ සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙම කමිටුවට පැවරී ඇත.

## සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ ආයතනික සංවිධාන ව්‍යුහය



# සමෘද්ධි සහනාධාර











**සමෘද්ධි සහනාධාර බෙදාදීම**
**(1996 සිට 1999 ජූනි දක්වා)**

**වැඩසටහන ක්‍රියාත්මක වන පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව - 22**
**වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය - රු. මි 8000**
**සහනාධාර වාරික වර්ග - රු. 1000, රු.500, රු.250, රු.200, රු.100**
**සහනාධාර නිකුත් කර ඇති සාමාන්‍ය පවුල් සංඛ්‍යාව - 1768921**
**මේ දක්වා නිකුත් කර ඇති සහනාධාර වල මුළු වටිනාකම - රු. මි. 27603**
**මාසික සාමාන්‍ය වටිනාකම - රු. මි. 626.25**

දිළිඳුකම පිටුදැකීමේ ජාතික වැඩසටහන ලෙස රජය මගින් දියත්කර ඇති සමෘද්ධි වැඩසටහන මගින් මුළු ජනගහනයෙන් 50.22% ක පමණ ප්‍රමාණයකට සහනාධාර ලබා දීම සඳහා වාර්ෂිකව රු. මිලියන 8000 ක පමණ මුදලක් වැයකර ඇත. මෙම සහනාධාර බෙදාහැරීමේ කටයුතු දිළිඳුසහන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරේ.

සමෘද්ධි සනහනාධාර වැඩසටහන යටතේ රු. 1500/- ට අඩු මාසික ආදායමක් ලබන පවුල් මාසික සහනාධාර ලැබීමට සුදුසුකම් ලබති. මෙම පවුල් අතුරින් රු.500/- අඩු මාසික ආදායමක් ලබන, එසේම පවුලේ සාමාජික සංඛ්‍යාව 4 දෙනෙකුට වැඩි වන පවුලක් සඳහා රු.1000/- ක දීමනාවක් මාසිකව ලබාදෙනු ලැබේ. ඉතිරි පවුල් සඳහා සාමාජික සංඛ්‍යාව අනුව රු.500/-, 250/-, 200/-, 100/- වශයෙන් සහනාධාර හිමිකම් ලබාදෙනු ලැබේ.

ලියාපදිංචි සමාජ සේවා ආයතනවල නේවාසිකයින්ටද, ආදායම් මාර්ගයක් නොමැති විවිධ ආගම්වල පූජකවරුන්ටද, තනි පුද්ගල ඒකක ලෙස සලකා රු.100/- ක මාසික දීමනාවක් ලබාදෙනු ලැබේ.

උතුරු, නැගෙනහිර ක්‍රියාන්විත සේවයේ නියුතු වුවන් දිරිගැන්වීමක් වශයෙන් පවුලේ ආදායම ගණන් ගැනීමේදී ක්‍රියාන්විත සේවයේ නියුතු සාමාජිකයා උපයන ආදායම පවුලේ ආදායමට එකතු නොකොට සෙසු සාමාජිකයින් උපයන මාසික ආදායම රු. 1500/- ට අඩුනම් එම පවුල් සඳහා මාසික දීමනාවක් ලබාදෙනු ලැබේ.

1997 වර්ෂයේ දී ජනසවි පනත අහෝසි කිරීමත් සමඟම එතෙක් ජනසවි වැඩසටහන යටතේ රු.250/- ක මාසික සහනාධාර දීමනාවක් ලබමින් සිටි පවුල් ද සමෘද්ධි වැඩසටහනට ඇතුලත් කොට අදාල දීමනාව ලබා දීමට කටයුතු කර ඇත.

## සමෘද්ධි සහනාධාර බෙදාදීම (1996 - 1999 ජුනි දක්වා)

මාසික වටිනාකම රු. මිලියන වලිනි.
වගු අංක 01

| සහනාධාර වටිනාකම රු. | 1996 | | 1997 | | 1998 | | 1999.06.30 දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1000 | 23310 | 23.31 | 17888 | 17.89 | 14224 | 14.22 | 13669 | 13.66 |
| 500 | 902675 | 451.34 | 900148 | 450.07 | 883579 | 441.78 | 889314 | 444.65 |
| 250 | 412257 | 103.06 | 561109 | 65.82 | 337035 | 84.25 | 330199 | 82.54 |
| 200 | 317774 | 63.55 | 329089 | 22.15 | 324149 | 64.82 | 323354 | 64.67 |
| 100 | 230389 | 23.04 | 221491 | 140.28 | 212979 | 21.29 | 212385 | 21.23 |
| එකතුව | 1886405 | 664.30 | 2029725 | 696.21 | 1771966 | 626.36 | 1768921 | 626.75 |








# ඉතිරි කිරීම්

### අනිවාර්ය ඉතිරිකිරීම්

දිළිඳු ජනතාවගේ ඉතිරි කිරීමේ පුරුද්ද සහ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමේ අරමුණින් අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමය හඳුන්වා දී ඇත. සමෘද්ධි වැඩසටහන යටතේ රු.1000/- සහ රු.500/- සහනාධාර ලබන පවුල්වලින් මසකට පිළිවෙලින් රු.200/- සහ රු.100/- බැගින් අයකර ඔවුන් සඳහා අනිවාර්යය ඉතිරිකිරීමේ අරමුදලක් අරඹා ඇත.

අනිවාර්ය ඉතිරිකිරීම් 1996 - 1999 ජුනි දක්වා

වගු අංක 02

| විස්තරය | 1996 | 1997 | 1998 | 1999.06.30 |
|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව | 925985 | 918036 | 897803 | 902983 |
| සමුච්ඡිත ඉතිරිකිරීම් | 1517.54 | 25119.77 | 3764.15 | 4347.09 |

සමෘද්ධි ප්‍රතිලාභින්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල් එක් එක් ප්‍රතිලාභියාගේ නමින් සමෘද්ධි ආයෝජන ගිණුම්වල තැන්පත් කර ඇත.

### ස්වේච්ඡා ඉතිරිකිරීම්

කුඩා කණ්ඩායම් ගත වූ සමෘද්ධි සහනාධාරලාභින්ගේ මූලික ක්‍රියාකාරකමක් වන ස්ව කැමැත්තෙන් කෙරෙන ඉතිරිකිරීම් මඟින් ගොඩනඟන කණ්ඩායම් අරමුදල ස්වේච්ඡා ඉතිරිකිරීම් යනුවෙන් හැඳින්වේ. මෙම මුදල් කණ්ඩායම් තුළ ණය ගනුදෙනු සඳහා යොදා ගැනීමෙන් පසු අතිරික්ත මුදල් සමූහ ගිණුමක් යටතේ සමෘද්ධි බැංකු සංගමයේ තැන්පත් කිරීම මඟින් සමූහ ඉතුරුම් ශක්තිය වර්ධනය කෙරේ.

ස්වේච්ඡා ඉතිරිකිරීම් 1996 - 1999 ජුනි දක්වා

වගු අංක 03

| විස්තරය | 1997 | 1998 | 1999.06.30 |
|---|---|---|---|
| කුඩා කණ්ඩායම් ගණන | 116565 | 183915 | 207890 |
| ස්වේච්ඡා ඉතිරිකිරීම් ප්‍රමාණය (රු.මි) | 271.34 | 407.21 | 449.45 |

## සහණාධාරලාභීන් සහ අනිවාර්ය ඉතිරිකිරීම් ප්‍රගතිය 1999-06-30 දිනට












## කුඩා කණ්ඩායම් ප්‍රගතිය 1999-06-30 දිනට












# සමෘද්ධි බැංකු සංගම්



| සමෘද්ධි බැංකු සංගම් වැඩ සටහන | |
|---|---|
| 1. පිහිටුවීමට අපේක්ෂිත බැංකු සංගම් සංඛ්‍යාව | - 1006 |
| 2. ක්‍රියාත්මක වන ප්‍රා.ලේ.කො. සංඛ්‍යාව අදියර හයකින් ක්‍රියාත්මක වේ. | - 251 |
| 3. දැනට අරඹා ඇති බැංකු සංගම් සංඛ්‍යාව | - 686 |
| 4. ඉදිරියේදී විවෘත කිරීමට සූදානම් බැංකු සංගම් සංඛ්‍යාව | - 320 |
| 5. බැංකුවල මුළු කොටස් හිමිකරුවන් සංඛ්‍යාව | - 881563 |
| 6. ඉතිරිකිරීම් තැන්පතු සංඛ්‍යාව | - 652131 |
| 7. ඉතිරිකිරීම් තැන්පතු වටිනාකම | - රු. මි. 350'31 |
| 8. ආයෝජනය කර ඇති මුදල | - රු. මි. 300 |
| 9. ලබාදී ඇති ණය සංඛ්‍යාව | - 129209 |
| 10. මුළු ණය වටිනාකම | - රු.මි. 516 |
| ණය ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය | - 98% |

දිළිඳු ජනතාවගේ ඉතිරිකිරීම් වර්ධනය කිරීම මගින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය දියුණුකර නිෂ්පාදන සඳහා යොමු කිරීමත් එදිනෙදා ඔවුන් අතර ඇතිවන සුළු ණය අවශ්‍යතා සපුරාලීම මඟින් අවිධිමත් ණය වෙළඳ පොලට ඔවුන් හසුවීම වැලැක්වීමත්, එමගින් ඔවුන් ණය බරින් මුදවා විධිමත් මූල්‍ය වෙළඳපලට යොමුකිරීමත් සඳහා සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන හඳුන්වා දී ඇත.

බැංකු සංගම් වැඩසටහනේ සුවිශේෂ අරමුණු වන්නේ,

1. ඉතිරිකිරීම් ප්‍රවර්ධනය තුළින් දිළිඳු ජනතාවගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීම
2. ඔවුන්ගේ හදිසි ණය අවශ්‍යතා සපුරාලීම
3. නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය ණය පහසුකම් ලබාදීම
4. දුප්පතුන් ශක්තිමත් ආර්ථික සංවිධානයක් තුලට ගැනීම
5. දිළිඳුකමින් මිදෙනු සඳහා නව ආදායම් මාර්ග හඳුන්වා දීම
6. අවිධිමත් ණය වෙළඳපලින් ඈත්කර විධිමත් ණය වෙළඳපලට අනුගත කිරීම.
7. ඇප සුරැකුම් ආදී ගැටළුවලින් මුදවා ගැනීම
8. ණය විනයක් ඇතිකිරීම මඟින් බැංකු පුරුදු ඇතිකිරීම

ග්‍රාමීය වසම් දහයක් පමණ එක්කොට පිහිටුවා ඇති සමෘද්ධි කලාපයකට එක් බැංකු සංගමයක් වන සේ බැංකු සංගම් පිහිටුවීම 1996 වසරේදී අරඹන ලද අතර 1999 ජූනි මාසය වනවිට සමෘද්ධි බැංකු සංගම් 686 ක් පිහිටුවනු ලැබ ඇත.

## බැංකු සංගම් සාමාජිකත්වය

1997 වර්ෂයට සාපේක්ෂව බැංකු සංගම්වල සාමාජික සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් 1998 වර්ෂය තුළ වර්ධනය වී ඇත. 1997 මුළු සාමාජික සංඛ්‍යාව 267784 ක් වූ අතර එය 1998 වර්ෂයේ දී 612063 දක්වා 128% කින් වර්ධනය වී ඇත. මෙයට ප්‍රධානතම හේතුව වූයේ iii වන අදියර යටතේ තවත් බැංකු සංගම් 178 ක් 1998 වර්ෂය තුළ බැංකු සංගම් පද්ධතියට අළුතින් එකතු වීමයි. 1999 ජූනි මාසය වනවිට බැංකු සංගම් සාමාජිකත්වය 881563 දක්වා වර්ධනය වී ඇත.

## බැංකු සංගම් සාමාජිකත්වය 1997-1999 ජූනි

වගු අංක 04

| සාමාජිකත්වය | 1997 | | 1998 | | 1999 ජූනි | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ස්ත්‍රී | 174314 | 64 | 200489 | 58 | 157507 | 55 | 532310 | 58 |
| පුරුෂ | 93470 | 36 | 143790 | 42 | 111993 | 45 | 349253 | 42 |
| එකතුව | 267784 | 100 | 344279 | 100 | 269500 | 100 | 881563 | 100 |



### බැංකු සංගම් කොටස් මුදල්

බැංකු සංගම් 686 තුළ කොටස් මුදල් ප්‍රමාණය 1997 වර්ෂයේදී රු. මිලියන 83.3 වූ අතර 1998 වර්ෂයේ රු. මිලියන 168.4 දක්වා වර්ධනය විය. 1999 ජූනි මාසය වනවිට මුළු කොටස් මුදල් ප්‍රමාණය රු. මිලියන 392.9 ක් විය.

## බැංකු සංගම් කොටස් මුදල් - 1997 - 1999 ජූනි

(රු. මිලියන)

වගු අංක 05

| වර්ගය | 1997 | | 1998 | | 1999 ජූනි | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම | ප්‍රතිශතය | වටිනාකම | ප්‍රතිශතය | වටිනාකම | ප්‍රතිශතය | වටිනාකම | ප්‍රතිශතය |
| කොටස් මුදල් ස්ත්‍රී | 55.486 | 67 | 103.750 | 66 | 89.01 | 84 | 248.24 | 63 |
| කොටස් මුදල් පුරුෂ | 27.793 | 33 | 64.685 | 34 | 52.14 | 16 | 144.61 | 37 |
| එකතුව | 83.279 | 100 | 168.435 | 100 | 141.15 | 100 | 392.85 | 100 |



### සමෘද්ධි බැංකු සංගම් ඉතිරිකිරීමේ ගිණුම්

ළමා, දිරියමාතා, සාමාජික, සාමාජික නොවන සහ සමූහ ඉතුරුම් වශයෙන් සමෘද්ධි බැංකු සංගම් ඉතිරි කිරීමේ ගිණුම් වර්ග 5 ක් ඇත. 1997 වර්ෂයේදී මුළු ඉතිරිකිරීමේ ගිණුම් සංඛ්‍යාව 135266 ක් වූ අතර 1998 වර්ෂයේදී 236881 දක්වා වර්ධනය විය. 1999 ජූනි මාසය වනවිට මුළු ඉතිරිකිරීමේ ගිණුම් සංඛ්‍යාව 652131 ක් විය.

## ඉතිරිකිරීමේ ගිණුම් 1997 - 1999 ජුනි

වගු අංක 06

| තැන්පතු වර්ගය | 1997 | | 1998 | | 1999 ජුනි | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සාමාජික | 70621 | 52 | 110474 | 54 | 180967 | 66 | 362062 | 56 |
| ළමා | 29285 | 22 | 46725 | 20 | 40029 | 15 | 116039 | 18 |
| දිරියමාතා | 7804 | 6 | 15795 | 8 | 15238 | 7 | 38837 | 5 |
| සාමාජික නොවන | 5023 | 4 | 13456 | 6 | 11261 | 8 | 29740 | 5 |
| සමූහ | 22533 | 16 | 50431 | 12 | 32489 | 5 | 105453 | 16 |
| එකතුව | 135266 | 100 | 236881 | 100 | 279984 | 100 | 652131 | 100 |



සමෘද්ධි බැංකු සංගම් තැන්පතුවල වටිනාකම 1997 දී රු. මිලියන 49.20 වූ අතර 1998 වර්ෂය තුළ එම මුදල රු. මිලියන 140 දක්වා 185% කින් වර්ධනය විය. 1999 ජුනි මාසය වනවිට සමස්ථ තැන්පතුවල වටිනාකම රු. මිලියන 350.31 කි.

### බැංකු සංගම් ණය නිකුත් කිරීම

1998 වසරේදී සමෘද්ධි බැංකු සංගම් මගින් සාමාජිකයින්ට ණය නිකුත් කිරීම ආරම්භ කරන ලදී. 1998 වර්ෂයේදී අනුමත කළ ණය සංඛ්‍යාව 70992 වූ අතර, ඉන් 67786 ක් සඳහා ණය නිකුත් කර ඇත. ඒවායේ වටිනාකම රු. මිලියන 236.16 කි. මෙය අනුමත ණය වලින් 92% ක ප්‍රතිශතයකි. නිකුත් කළ ණයවලින් 23% ක් කෘෂිකාර්මික ණය වූ අතර 76% ක් වෙනත් ස්වයං රැකියා සඳහා විය. 1999 ජුනි මාසය වනවිට අනුමත ණය සංඛ්‍යාවෙන් 85% කට ණය ලබාදී ඇති අතර ණය අයකර ගැනීමේ ප්‍රතිශතය 98% කි.

### බැංකු සංගම් ආයෝජන

1999 වර්ෂයේ ජුනි මාසය අවසාන වනවිට බැංකු සංගම්වල තිබූ මුළු වත්කම් ප්‍රමාණය රු. මිලියන 845.5 ක් විය. මින් රු. මිලියන 300 ක් එනම්, 35% ක් භාණ්ඩාගාර බිල්පත් හා සුරැකුම්පත් වල ආයෝජනය කර තිබුණි. රු. මිලියන 304.6 ක් පමණ ප්‍රමාණයක් පිටහිටි ණය වූ අතර එය මුළු වත්කම්වලින් 36% ක් විය.

# සමෘද්ධි බැංකු සංගම් ප්‍රගතිය 1999-06-30 දිනට

වාර්ෂිකව එකතුවන තැන්පතු සංඛ්‍යාව 1997-1999 පුනි දක්වා




වාර්ෂිකව එකතුවන මුළු සාමාජික සංඛ්‍යාව 1997-1999 පුනි දක්වා




තැන්පතුවක සාමාන්‍ය වටිනාකම තැන්පතු අනුව 1999 පුනි වනවිට




වාර්ෂිකව එකතුවන සමස්ථ කොටස් මුදල් 1997-1999 පුනි දක්වා




සමෘද්ධි බැංකු සංගම් සමුච්චිත තැන්පතු සංඛ්‍යාව
එක් එක් වර්ෂය අනුව ප්‍රතිශතයක් වශයෙන්




සමෘද්ධි බැංකු සංගම් සමුච්චිත ණය සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව ප්‍රතිශතය



# ප්‍රජා ව්‍යාපෘති



**ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන**

ක්‍රියාත්මක ප්‍රා.ලේ. කොට්ඨාශ ගණන - **283**
වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (1999) - රු. මි. **365**
කඩිනම් ග්‍රාම සංවර්ධන වැඩසටහන යටතේ ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය (1999) - රු. මි. **250**
ව්‍යාපෘති වර්ග - මාර්ග, වාරිමාර්ග, ගොඩනැගිලි, කර්මාන්ත, ජලසම්පාදන හා පොදු පහසුකම්
මෙතෙක් ආයෝජනය කර ඇති මුදල රු. මි. - **1875.72**
මෙතෙක් නිමකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව - **40548**

ප්‍රජා ව්‍යාපෘති සංවර්ධන වැඩසටහනෙහි අරමුණ වනුයේ ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතා අනුව සංවර්ධනයට අදාල ආර්ථික යටිතල පහසුකම් සැපයීමයි. ඒ අනුව වාරිමාර්ග, ඇල වේලි, අමුණු 4954 ක්ද, පොදු ළිං, කෘෂි ළිං, කුඩා පරිමාණයේ ගුරුත්ව ජල යෝජනා ක්‍රම 9559 ක්ද, කෘෂි නිෂ්පාදනයට අදාල ප්‍රවාහන මාර්ග, පාලම්, බෝක්කු, පඩි පෙලවල් 18710 ක්ද, නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන, එකතු කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිලි 3344 ක්ද, වෙනත් සමෘද්ධි බැංකු, කලාප කාර්යාල ආදි ගොඩනැඟිලි 3981 ක්ද නිම කර තිබේ. වාර්ෂිකව නිම කරන ලද ප්‍රජා ව්‍යාපෘති සංඛ්‍යාව ගත්කල 1995 වර්ෂයේදී 11345 ක්ද, 1996 වර්ෂයේදී 11640 ක්ද, 1997 වර්ෂයේදී 11288 ක්ද, 1998 වර්ෂයේදී 6061 ක්ද, 1999 වර්ෂයේ ජුනි මාසය වනවිට ප්‍රජා ව්‍යාපෘති 214 ක්ද නිමකර තිබේ.

ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන 1995 - 1999 ජුනි

වගු අංක 07

| වර්ෂය | දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ | ප්‍රා.ලේ කොට්ඨාශ | ආයෝජනය රු.මි. | නිමි ව්‍යාපෘති |
|---|---|---|---|---|
| 1995 | 18 | 235 | 114.06 | 11345 |
| 1996 | 18 | 235 | 210.62 | 11640 |
| 1997 | 18 | 235 | 562.54 | 11288 |
| 1998 | 21 | 283 | 373.50 | 6061 |
| 1999 | 21 | 283 | 615.00 | 214 |
| එකතුව | 21 | 283 | 1875.72 | 40548 |

1995 සිට 1998 වර්ෂය දක්වා සිව් අවුරුදු කාලය තුළ ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන යටතේ වියළි කලාපීය වැව් සංවර්ධනය කිරීම. ග්‍රාමීය සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීම සමෘද්ධි කලාප 218 ක් සංවර්ධනය කිරීම, සමෘද්ධි බැංකු හා කලාප කාර්යාල ඉදිකිරීම, වෘත්තිය පුහුණුව වැනි වැඩසටහන් මඟින් ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීමට කටයුතු කර තිබේ. ඒ අනුව 1999 වර්ෂයේ ජුනි මාසය වනවිට මෙතෙක් නිමකර ඇති මුළු ප්‍රජා ව්‍යාපෘති සංඛ්‍යාව 40548 ක් වන අතර ඒ සඳහා රු.මි. 1875.72 ක් ආයෝජනය කර ඇත.

"රන්කෙතට දියවර" කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 1999 වර්ෂය තුළ අමතර රු. මිලියන 250 ක් යොදවා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සෑම කලාපයකටම ලබාදීමට කටයුතු කර ඇත.

## ප්‍රජා ව්‍යාපෘති -1995 - 1999 ජුනි

වගු අංක 08

| ව්‍යාපෘති වර්ගය | 1995 නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | 1996 නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | 1997 නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | 1998 නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | 1999 නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. වාරිමාර්ග, ඇලවේලි, අමුණු | 1401 | 1048 | 1600 | 783 | 122 | 4954 |
| 2. පොදු ළිං, කෘෂි ළිං, කුඩා පරිමාණයේ ගුරුත්ව ජල යෝජනා | 3232 | 3488 | 1670 | 1151 | 18 | 9559 |
| 3. කෘෂි නිෂ්පාදනයට අදාල ප්‍රවාහන මාර්ග, පාලම්, බෝක්කු, පඩිපෙළවල් | 4794 | 6065 | 4907 | 2902 | 42 | 18710 |
| 4. නිෂ්පාදන, අලෙවි මධ්‍යස්ථාන එකතු කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැඟිලි | 884 | 863 | 563 | 1017 | 17 | 3344 |
| 5. වෙනත් (සමෘද්ධි බැංකු, කලාප කාර්යාල ආදි) | 1034 | 176 | 2548 | 208 | 15 | 3981 |
| එකතුව | 11345 | 11640 | 11288 | 6061 | 214 | 40548 |



### නාගරික ව්‍යාපෘති

කොළඹ, ගාල්ල, කුරුණෑගල, මහනුවර වැනි නාගරික ප්‍රදේශවල අවශ්‍යතාවයන් සලකාබලා සුදුසු ආර්ථික යටිතල පහසුකම් සපයාදීමත් ඊට අදාල මානව සම්පත් සංවර්ධන වැඩසටහන් දියත් කිරීමත් අරමුණු කොටගෙන මෙම වැඩසටහන අරඹා ඇත. ඒ අනුව පොදු ජලනල, වැසිකිලි පද්ධති, පැති කානු වැනි නාගරික ව්‍යාපෘති 128 ක් නිමකර ඇත.

### වතු ව්‍යාපෘති

මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, රත්නපුරය යන දිස්ත්‍රික්කවල වැවිලි ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා වතුවල පදිංචි දිළිඳු ජනතාවට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා මෙම වැඩසටහන අරඹන ලදී. ඒ අනුව වතු ආශ්‍රිත සමෘද්ධි කලාපවල ප්‍රජා ව්‍යාපෘති 233 ක් මේ වනවිට අවසන් කර තිබේ.

## ප්‍රජා ව්‍යාපෘති ප්‍රගතිය 1999-06-30 දිනට


















# වෘත්තීය පුහුණු සහ සුළු කර්මාන්ත සංවර්ධන වැඩසටහන



## වෘත්තිය පුහුණු වැඩසටහන

සමෘද්ධි ප්‍රතිලාභි පවුල්වල රැකියා විරහිත තරුණ, තරුණියන්ට ඵලදායි රැකියා ලබාගැනීම සඳහා අවශ්‍ය වන වෘත්තිය පුහුණුව ලබාදීම සහ එවැනි වෘත්තිය පුහුණුවීම් ලබාගත් අය සඳහා සවණ සහ සසණ ණය වැඩසටහන් යටතේ ණය ලබාදී ස්වයං රැකියා ආරම්භ කිරීමට කටයුතු කිරීම අරමුණු කොටගෙන තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 50ක වෘත්තිය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 1998 වසර තුළ වෘත්තිය පුහුණුව සඳහා 1040 දෙනෙක් යොමුකර ඇති අතර, මේ වනවිට පුහුණුවෙන් පසු ස්වයං රැකියා ණය ලබාගෙන 39 දෙනෙකු ව්‍යාපාර ආරම්භ කර ඇත. පුහුණුව අවසානයේ වැටුප් ලබන රැකියාවල් ලබාඇති සංඛ්‍යාව 129 කි. 1999 වසරේදි තෝරා ගන්නා ලද තරුණ තරුණියන් දහසකට වෘත්තිය පුහුණුව ලබාදිමට කටයුතු කර ඇත. මෙම වෘත්තිය පුහුණුව ලබා දෙනු ලබන්නේ ජාතික තරුණ සේවා සභාව හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය මගිනි.

## සුළු කර්මාන්ත සංවර්ධන වැඩසටහන

සුළු කර්මාන්තයන්හි නියැලි සමෘද්ධි ප්‍රතිලාභි පවුල් සංවිධාන ගතකර ඔවුන්ගේ කර්මාන්ත වඩාත් ඵලදායිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යය තාක්‍ෂණ සහාය, වෙළඳපල සහාය, ප්‍රාග්ධන සහාය ලබාදී එමගින් ඔවුන්ගේ පවුල්වල ආදායම් මට්ටම වැඩි දියුණු කිරීමට කටයුතු කෙරේ. මෙම වැඩසටහන යටතේ කුඩා කර්මාන්තකරුවන් 1896 දෙනකු සඳහා රු. මිලියන 61.76 ක ණය මුදලක් ලබාදී ඇත. එමගින් අදාල පවුල්වල ආදායම් මට්ටම රු. 3000 සිට රු. 5000 අතර ප්‍රමාණයකින් වැඩිවී ඇති බව වාර්තා වී ඇත.

1999 වසරේදී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 244 කින් තෝරා ගත් 6000 ක කණ්ඩායමක් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දී රුපියල් මිලියන 85.6 ක මුදලක් ණය වශයෙන් ලබාදීමට කටයුතු සැලසුම් කර ඇත.

අදාල තාක්‍ෂණික පුහුණුව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය මගින් ලබාදීමට කටයුතු කර ඇති අතර ණය මුදල් ලබා දෙනු ලබන්නේ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මගිනි.

# සමාජ සංවර්ධන වැඩසටහන












| සමාජ සංවර්ධන හා සුභසාධන වැඩසටහන් | 1997 | 1998 | 1999.06.3 |
|---|---|---|---|
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 300 | 1640 | 781 |
| වැඩිහිටි සුභසාධනය | 101 | 590 | 672 |
| ආබාධිත සුභසාධනය | 61 | 490 | 318 |
| ළමා සුභසාධනය | 82 | 486 | 823 |
| කාන්තා සුභසාධනය | 94 | 558 | 398 |
| මැද පෙරදිග ගිය පවුල් සුභසාධනය | 196 | 1822 | 2663 |
| මුළු වැඩසටහන් සංඛ්‍යාව | 839 | 5785 | 5655 |
| වැයකළ මුළු මුදල රු. මිලියන | 3.556 | 2.393 | 1.616 |

සමාජයේ අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවන අතරම ඔවුන් සමාජයීය හා සංස්කෘතික වශයෙන්ද, සංවර්ධනය කිරීම සමෘද්ධි වැඩසටහනෙහි අරමුණයි. ඒ අනුව මත්ද්‍රව්‍ය නිවාරණය, ළමා සුභ සාධනය, වැඩිහිටි සුභසාධනය, ආබාධිත සුභසාධනය ආදී විවිධ සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

මෙම වැඩසටහන් වඩාත් ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සමාජ සංවර්ධන පදනම් පිහිටුවා ඇත. සමාජ සංවර්ධන පදනම සඳහා අරමුදල් සපයාගනු ලබන්නේ ජාතික මට්ටමේ කොඩි අලෙවියෙන් ලබා ගන්නා අරමුදලට සාපේක්ෂව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ද 25% ක මුදලක් ලබාදීමෙනි. ඒ අනුව කොඩි අලෙවියෙන් 1998 වර්ෂය වනවිට රු.මි. 6.67 ක් උපයාගෙන ඇති අතර රු.මි. 1.30 ක මුදලක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ලබාදී ඇත. ඒ අනුව 1998 වර්ෂය අවසන් වනවිට රු.මි. 7.352 ක් ඉහත වැඩසටහන් සඳහා වැයකර ඇත. 1999 වර්ෂයේ මැයි 31 පැවැත්වුනු ලෝක දුම්වැටි විරෝධී දිනය පදනම් කරගත් කොඩි අලෙවියේදී රු. ලක්ෂ 40 ක ආදායමක් ලබාඇත. මෙම ආදායම් සමාජ සුභසාධන කටයුතු සඳහා වැය කර ඇත.

## සමෘද්ධි ශ්‍රමාභිමානී පුහුණු කඳවුරු

සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා සමෘද්ධි ශ්‍රමාභිමානී පුහුණු කඳවුරු පැවැත්වීමට කටයුතු කර ඇත.

සහභාගිවන්නන් විසින්ම වැඩසටහන මෙහෙයවීම මෙහි සුවිශේෂ ලක්ෂණය වේ. කඳවුරක් තුළ සිටිමින් කඳවුරු භූමියෙන් ලබාගත හැකි සීමිත සම්පත් ප්‍රමාණයක් උපයෝගී කොට ගනිමින් සුවපහසුව සලසා ගැනීමටත්, සිය නිර්මාණයන් බිහි කිරීමටත් මෙහිදී අවස්ථාව ලැබෙන අතර, ඔවුනොවුන් තුළ සහයෝගය, සහජීවනය, සහභාගිත්වය, සහෝදරත්වය, පරෝපකාරය හා නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමට ද මෙමගින් අවස්ථාව සැලසේ.

1999.06.30 වනවිට සමෘද්ධි ශ්‍රමාභිමානී පුහුණු කඳවුරු 4 ක් ඇඹිලිපිටිය යෝධගම ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ දී මාතර, නිල්වලා අධ්‍යාපන පීඨයේ දී මහියංගණ මධ්‍ය මහා විද්‍යාලයේ දී හා මිහින්තලා මහා විද්‍යාලයේදී පවත්වන ලදී. මෙම පුහුණු කඳවුරු මගින් සමෘද්ධි නියාමකයින් තුන්දහසක් පමණ පුහුණු කරනු ලැබ ඇත.

# අලෙවි සංවර්ධන වැඩසටහන



අලෙවි සංවර්ධන වැඩසටහනේ අරමුණ වන්නේ නිෂ්පාදකයාට වැඩි මිලක් පාරිභෝගිකයාට සහන මිලක් සහ ස්වයං රැකියා අවස්ථාවන් සලසාදීමයි. ඒ අනුව සෑම සමෘද්ධි බැංකු සංගමයක් ආශ්‍රිතවම සමෘද්ධි අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. ඒ යටතේ අලෙවි මධ්‍යස්ථාන 100 ක් මේ වනවිට ආරම්භ කර ඇති අතර එම සංඛ්‍යාව 900 දක්වා වැඩිකිරීමට නියමිතය. ජංගම වෙළඳ කුටි 50 ක් මේ වනවිට හඳුන්වා දී ඇති අතර එය 1999 වර්ෂය තුළ 100 දක්වා වැඩි කරනු ඇත.

මෙයට අමතරව සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම සතිපොලවල් දෙකක් ආරම්භ කිරීම සඳහා අත්හදා බැලීම් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම වර්ෂය තුළ දැනට ග්‍රාමීය සති පොළවල් 127 ක් ආරම්භ කර ඇත. 1999 වර්ෂය අවසාන වීමට ප්‍රථම ග්‍රාමීය සතිපොලවල් 250 ක් අලුතෙන් ආරම්භ කිරීමට ද අවශ්‍ය පියවර ගෙන ඇත.

# සමාජ ආරක්ෂණ වැඩසටහන

එදිනෙදා ජිවිතයේදී මුහුණ පාන්නට සිදුවන හදිසි අවස්ථා වන මරණ, අසනීප, විවාහ වැනි විවිධ අවස්ථා හේතු කොටගෙන දිළිඳු පවුල් නිතර මුදල් ප්‍රශ්ණවලට මුහුණ දෙති. මේ හේතු කොටගෙන බොහෝ විට ණය මුදල් ලබාගැනිම ඔවුන් අතර සුලභව දක්නට ලැබේ. මේ නිසා ඔවුන් දිළිඳුකමේ සිට අසරණ තත්ත්වයට පත්වීමක් සිදුවන බැවින් එවැනි අවස්ථාවන්හිදී ඔවුන්ට උපකාර කිරීම සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබ ඇත.

සහනාධාරලාභී දුප්පත් පවුල් සඳහා පිහිටුවා ඇති මුල්ම සමාජ ආරක්ෂණ වැඩසටහන වන මෙහි, මූලික අරමුණු පහත දැක්වේ.

- දිළිඳු පවුල් දැනට සිටින තත්ත්වයෙන් තවදුරටත් පහතට වැටීමට බලපෑහැකි හදිසි ආපදා වැනි වියදම් දැරීමට සිදුවන පවුලේ විවිධ අවස්ථාවන්හිදී එම බර අවම කරගැනිම සඳහා ආපසු අය නොකරන රක්ෂණ ආධාර මුදලක් පවුලට සැපයීම.













- දිළිඳු පවුල්වල ආර්ථික හැසිරීම් රටාව ඵලදායීව වෙනස් කිරීමට උපකාරවන ආකල්ප වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සාමූහික ශක්ති වර්ධනයට හා ආර්ථික ශක්ති වර්ධනයට උපකාරවීම මඟින් මානව හිතවාදී සමාජ ආරක්ෂණ ජාලයක් ඇතිකිරීම.

**සමාජ ආරක්ෂණ වැඩසටහන**

| | |
|---|---|
| සාමාජිකත්වය | - රු. 1000, 500, 250 සහනාධාරලාභීන් |
| සාමාජික මුදල | - මාසික රු. 25/= |
| සාමාජික පවුල් සංඛ්‍යාව | - 1285000 |
| එකතු වූ වාරික මුදල | - රු. මි. 513 |

**මෙතෙක් ආරක්ෂණ පහසුකම් ලබාදී ඇති මුළු පවුල් සංඛ්‍යාව**

| | 1997 | 1998 | 1999 ජූනි |
|---|---|---|---|
| උපත් | 22044 | 24801 | 3470 |
| විවාහ | 21353 | 29614 | 7317 |
| ලෙඩ රෝග | 6448 | 9691 | 3983 |
| මරණ | 11543 | 16569 | 5432 |
| එකතුව | 61388 | 80675 | 20202 |

**ආරක්ෂණ පහසුකම් සඳහා වැයකර ඇති මුළු මුදල- රු.මි.426.03**

| 1997 | 1998 | 1999 |
|---|---|---|
| 169.78 | 212.16 | 44.09 |

මේ අනුව පිහිටුවා ඇති සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ රු.1000, 500 සහ 250 සහනාධාර ලාභීන්ගෙන් මාසිකව රු. 25 ක වාරික මුදලක් ලබාගෙන හදිසි ආපදාවකදී හෝ උත්සව අවස්ථාවකදී පහත දැක්වෙන පහසුකම් ලබාදෙනු ලැබේ.

- පවුලේ සාමාජිකයකුගේ මරණයකදී රු.5000 ක මුදලක්
- සාමාජිකයා රෝගී වීමකදී - දිනකට රු.50/- බැගින් වසරකට උපරිම දින 30 ක් සඳහා රු.1500/- ක මුදලක්
- පවුලේ සිදුවන විවාහයකදී - සාමාජිකයාට රු.3000/- ක මුදලක් යැපෙන්නකුට රු.1000/- ක මුදලක්
- දරු උපතකදී - පළමුවන හෝ දෙවන දරු උපත සඳහා රු. 2000 ක මුදලක්

## සමාජ ආරක්ෂණ වැඩ සටහනේ ප්‍රගතිය 1999-06-30 දිනට











සමාජ ආරක්‍ෂණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරෙන වෙනත් වැඩසටහන්

## 1. අධ්‍යාපනික වැඩසටහන්

I. සමෘද්ධි නැණ නුවණ ශිෂ්‍යත්ව ලබාදීම

- ද්විතියික අධ්‍යාපනික ශිෂ්‍යත්ව ලබාදීම
- විශ්ව විද්‍යාල අධ්‍යාපනය (තරුණ සේවා, සරසවිය) සඳහා ශිෂ්‍යත්ව ලබාදීම
- වෘත්තිය අධ්‍යාපනය සඳහා අවස්ථා
- ආගමික අධ්‍යාපනය සඳහා අවස්ථා

II පාසැල් උපකරණ හා අභ්‍යාස පොත් ලබාදීම

III පෙර පාසැල් ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම

IV දහම් පාසැල් සංවර්ධනය සඳහා සහාය ලබාදීම

V චිත්‍ර/ පෝස්ටර්/ කථික/ රචනා/ දැනුම මිනුම තරඟ පැවැත්වීම

## 2. සෞඛ්‍ය හා පෝෂණ කටයුතු

I ක්‍රීඩා ශිෂ්‍යත්ව පිරිනැමීම

II ක්‍රීඩා උපකරණ සැපයීම

III ග්‍රාමීය ප්‍රථමාධාර ඒකක පිහිටුවීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම

IV පවුල් සැලසුම්, ගෘහ සාත්තු සේවා ඒකක පිහිටුවීම

## 3. ආදායම් හා රැකියා උත්පාදන කටයුතු

I ස්වයං රැකියා සඳහා සහණ ණය පදනම මත මහන මැෂින් ඇතුළු උපකරණ සැපයීම

II වෙළඳපල පදනම් කරගත් නව නිර්මාණ ඉදිරිපත් කරන නිර්මාණකරුවන් සඳහා විශේෂ අනුග්‍රාහක ආධාර සැපයීම

# ශ්‍රම සූක්ෂම ජනතා ව්‍යාපෘති වැඩසටහන







සමෘද්ධි වැඩසටහන යටතේ කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට උපකාරිවන කුඩා වැව්, සුළු වාරිමාර්ග ආදිය ප්‍රතිසංස්කරණය කිරීම හා කෘෂිකාර්මික ළිං ඉදිකිරීම යන කටයුතු ශ්‍රම සූක්ෂම ක්‍රම උපයෝගි කරගනිමින් සමෘද්ධි බලකායන් ලවා ඉටුකිරීමේ වැඩසටහනක් ලෙස මෙම ව්‍යාපෘතිය සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරඇත.

වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ගම්මානවල ගොවි ජනතාවට කෘෂිකාර්මික කටයුතු සඳහා ජල පහසුකම් සැපයීම හා එම පහසුකම් වැඩි දියුණු කිරීමට සහභාගිවන සහනාධාරලාභි ශ්‍රමිකයන්ට ආදායමක් උපයාගැනීමට සැලැස්වීමත්‍ය. ඒ අනුව වැඩි ශ්‍රම දායකත්වයක් මේ සඳහා ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. එම කටයුතු දිවයිනේ දිස්ත්‍රික්ක 20 ක ක්‍රියාත්මක වේ.

1999 වර්ෂය වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 100 ක ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම රු. මි. 100 ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක 20 කට වෙන්කර දී ඇත. ව්‍යාපෘති සංඛ්‍යාව, යොදාගනු ලබන ශ්‍රම ඒකක ප්‍රමාණය හා එම ව්‍යාපෘතියෙන් වගා කිරීමට අපේක්ෂිත අක්කර ප්‍රමාණය පහත සටහනින් දැක්වේ.

**ශ්‍රම සූක්ෂම ජනතා ව්‍යාපෘති වැඩසටහන**

| | |
|---|---|
| ක්‍රියාත්මක දිස්ත්‍රික්ක ගණන | - **20** |
| වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය | - රු. මිලියන **100** |
| ක්‍රියාත්මක මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | - කුඩා වැව් - **100** |
| | සුළු වාරිමාර්ග - **340** |
| | කෘෂි ළිං හා වෙනත් - **40** |
| ජල පහසුකම් ලබාදීමට අපේක්ෂිත අක්කර ගණන | - **21254** |
| ලබා ගැනීමට අපේක්ෂිත ශ්‍රම ඒකක ගණන | - **4000154** |
| එක් ව්‍යාපෘතියක වටිනාකම | - ලක්ෂ **05** |
| ව්‍යාපෘති නිමකිරීමට අපේක්ෂිත කාලය | - මාස **06** |
| වගාකිරීමට අපේක්ෂිත අක්කර ප්‍රමාණය | - **21254** |








# කෘෂි සංවර්ධන වැඩසටහන

සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් 80% ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන අතර ඉන් වැඩි ප්‍රතිශතයකගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වේ. ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට ඔවුන් සතු සම්පත් ආශ්‍රිතව කෘෂිකාර්මික අංශයෙන් ඉටු කළ හැකි කටයුතු ඉටු කිරීම සඳහා පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

i. ගෙවතු වගා වැඩසටහන

ii. දේශීය ඖෂධ භෝග වගා ව්‍යාපෘති

iii. පාරිසරික /රුක් රෝපණ වැඩසටහන්

iv. ස්වයං රැකියා අරමුණු කරගත් විශේෂ කෘෂි සංවර්ධන ව්‍යාපෘති

v. නව තාක්ෂණික කෘෂිකාර්මික කටයුතු ප්‍රචලිත කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්

ඒ අනුව කෘෂි සංවර්ධන වැඩසටහනේ මූලික අරමුණු මෙසේය.

1. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ගෙවතු සංවර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ ආහාර සඳහා යන වියදම අඩුකර ජීවන තත්ත්වය උසස් කිරීම
2. සුළු පරිමාණ ගොවිතැනෙහි නිරතවන ප්‍රතිලාභීන් පාරිසරික ගොවිතැනට යොමු කිරීම තුළින් කෘෂි නිෂ්පාදන සඳහා වැයවන වියදම අවමකර ලාභ ලබාගැනීමේ තත්ත්වයට ගෙන ඒම
3. ස්වයං රැකියා සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් ලබාදීම.
4. ආර්ථික වටිනාකමින් යුත් රුක් රෝපණය කිරීම තුළින් පරිසර සංරක්ෂණය හා ගෙවතු වගාකිරීමට හිතකර පරිසරයක් ගොඩනැඟීම.

## I. ගෙවතු වගා වැඩසටහන

ගෙවතු වගා කිරීම සහ සංවර්ධනය කිරීම තුළින් අඩු ආදායම්ලාභීන්ගේ වියදම් අවම කිරීම සහ ආදායම් වැඩි කිරීම තුළින් පෝෂණ තත්ත්වය නංවාලීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ. මේ යටතේ සෑම කලාපයකම පැලතවානක් ආරම්භ කිරීමත් සෑම ග්‍රාම නිලධාරි වසමකම ආදර්ශ ගෙවත්තක් ඇති කිරීමත් සිදුකෙරේ. ඒ අනුව 1996 වසරේදී ගෙවතු 2640 ක්ද, 1997 දී 1300 ක්ද, 1998 දී 6100 ක්ද නිමකර ඇති අතර 1999 ජුනි මාසය වනවිට ගෙවතු 2374 ක් සංවර්ධනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සූදානම් කර පැල තවාන් 87 ක්ද සකස් කර තිබුණි.











## II. දේශීය ඖෂධ භෝග වගාව

දේශීය ඖෂධ පැලෑටි වගාකිරීම ව්‍යාපාර මට්ටමින් ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකෙරේ. 1997 වර්ෂයේදී ඖෂධපැල තවාන් 17 ක්ද, 1998 වර්ෂය වනවිට ඖෂධ පැල තවාන් 78 ක්ද නිම කර ඇත.

## III. පාරිසරික රුක්රෝපණ වැඩසටහන

දීර්ඝ කාලීන වශයෙන් පරිසරය සුරැකීමේ අරමුණින් සෑම ග්‍රාම නිලධාරි වසමකම සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ඇතිව පැල වර්ග ගෙවතුවල හෝ පොදු ස්ථානවල රෝපණය කෙරේ. මෙමඟින් කුඩා ඉඩම් හිමියන්ට ආදායම් ලබාදීමටත්, උස්බිම් පෝෂක ප්‍රදේශවලට ආරක්ෂාව සැලසීමෙන් පාංශු ඛාදනය, නාය යෑම්, ජල ගැලීම්, ජල උල්පත් සිඳී යෑම් වැනි ව්‍යසනයන් අවම කිරීමත් සිදුවේ. ඒ අනුව 1998 වර්ෂයේදී පැල 781398 ක් පමණ රෝපණය කරන ලදී. 1999 නොවැම්බර් මාසයේදී වර්ෂා කාලය ආරම්භ වීමත් සමඟම රුක් රෝපණ වැඩසටහන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

## IV. කෘෂි කාර්මික සංවර්ධනයට අදාල දැනුවත් කිරීම්

සම්ප්‍රදායික කෘෂිකාර්මික ආකල්පවලින් මිදී නවීන තාක්ෂණික උපක්‍රම යොදා ගැනීම මඟින් කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක වර්ධනය අපේක්ෂා කෙරේ. බිම්මල් වගාව, මී මැසි පාලනය හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැනි ක්ෂේත්‍රවල ස්වයං රැකියා ආරම්භ කිරීමට අවශ්‍ය මූලික දැනුවත් කිරීම් සහ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් 451 ක් පවත්වා ඇත.

## V. විශේෂ කෘෂි සංවර්ධන ව්‍යාපෘති

මෙම වැඩසටහන යටතේ ගම්පහ, පොළොන්නරුව, අනුරාධපුරය, නුවරඑළිය, කුරුණෑගල හා ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි හඳුනාගත් විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ. මේ අනුව කෙසෙල් කෙඳි ව්‍යාපෘතියක්, අන්නාසි වගා කිරීමේ හා විසිතුරු මල් වගා ව්‍යාපෘතියක් මේවන විටද සාර්ථකව ක්‍රියාත්මක වේ.

# ණය වැඩසටහන්



සමෘද්ධි සහනාධාරලාභීන්ගේ ආදායම් මට්ටම වැඩි දියුණු කිරීමට අදාලවන ආයෝජනවල යෙදවීම සහ ඔවුන්ගේ අනෙකුත් අවශ්‍යතා සඳහා ණය ලබාදීමේ අරමුණින් විවිධ ණය වැඩසටහන් හඳුන්වා දීමට කටයුතු කර ඇත. මේ යටතේ කඩිනම් ණය නියාමක වැඩසටහන, සමෘද්ධි සංවර්ධන ණය වැඩසටහන, සමෘද්ධි ව්‍යවසායකත්ව ණය වැඩසටහන, සමෘද්ධි කල්බදු ණය වැඩසටහන සහ සමෘද්ධි සුළු කර්මාන්ත ණය වැඩසටහන ක්‍රියාත්මක වේ.

## 1. කඩිනම් ණය නියාමක වැඩසටහන

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හදිසි ණය අවශ්‍යතා සැපිරීමේ අරමුණින් 1996 වසරේ සිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. එමඟින් පාරිභෝගික හා ආපදා ණය අවශ්‍යතා සඳහා මෙන්ම සංවර්ධන ණය අවශ්‍යතා සඳහා ද 4.5% පොලි අනුපාතයක් යටතේ ණය මුදල් ලබාදෙනු ලැබේ.

ඒ යටතේ මෙතෙක් ලබාදී ඇති මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

**කඩිනම් ණය නියාමක වැඩසටහන 1996 - 1999 ජුනි**

වගු අංකය 09

| ණය වර්ගය | 1996 | | 1997 | | 1998 | | 1999 ජුනි | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුදල (රු.මි) | සංඛ්‍යාව | මුදල (රු.මි) | සංඛ්‍යාව | මුදල (රු.මි) | සංඛ්‍යාව | මුදල (රු.මි) |
| පාරිභෝගික /ආපදා | 6024 | 2.92 | 16639 | 7.60 | 23565 | 11.21 | 26196 | 12.58 |
| සංවර්ධන | 16498 | 15.26 | 42938 | 39.46 | 71352 | 67.20 | 84692 | 80.14 |



මෙම ණය වැඩසටහන යටතේ 1998 වර්ෂයේදී ලබාදී තිබූ මුළු ණය ප්‍රමාණය රු. මිලියන 78.41 කි. මින් 86% ක් සංවර්ධන ණය වූ අතර ඉතිරි 14%, පාරිභෝගික හා ආපදා ණය විය. 1999 වර්ෂයේ ජූනි මාසය වනවිට ලබාදී තිබූ මුළු ණය ප්‍රමාණය රු.මි. 92.27 කි. මින් 86% ක් සංවර්ධන ණය වූ අතර ඉතිරි 14% පාරිභෝගික ආපදා ණය විය.

## 2. සමෘද්ධි සංවර්ධන ණය (සසණ)

සමෘද්ධිලාභීන්ගේ පවුල්වල ආදායම් හා ජීවන තත්ත්වය ඉහළ දැමීමේ අරමුණින් ක්‍රියාත්මක කර ඇති මෙම ණය වැඩසටහන මහජන බැංකුව හා ලංකා බැංකුව මඟින් උතුරු නැගෙනහිර පළාත්වලට අයත් දිස්ත්‍රික්කවල හැර මුළු දිවයිනේම බලකායන් 12141 ක් තුළ ක්‍රියාත්මක වේ. එක් බලකායක් තුළ ණය නිකුත් කිරීම සඳහා රු. 41500 ක මුදලක් ලබාදෙන ලදී. මේ යටතේ වෙන්කර ඇති මුළු මුදල රු. මිලියන 592 කි. එක් අයෙකුට රු. 2500 සිට රු. 10,000 දක්වා මුදලක් ණය වශයෙන් ලබාදේ. වාර්ෂික පොළිය 10% කි. 1998 වර්ෂය අවසන් වනවිට නිකුත් කොට ඇති ණය සංඛ්‍යාව 77357 ක් වූ තර වටිනාකම රු. මිලියන 457 කි. 1999 ජූනි මාසය වනවිට සසණ ණය වැඩසටහන යටතේ නිකුත් කොට ඇති ණය සංඛ්‍යාව 80361 වූ අතර එහි වටිනාකම රු. මිලියන 478 කි.

## 3. සමෘද්ධි ව්‍යවසායකත්ව ණය (සවණ)

සමෘද්ධි ප්‍රතිලාභී පවුල් මඟින් අරඹනු ලබන නව ව්‍යාපාරවලට අයත් සහ දැනට පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර වැඩි දියුණු කිරීමට මෙම ණය ක්‍රමය යටතේ ණය මුදල් ලබාදෙනු ලැබේ.
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය , ලංකා බැංකුව හා මහජන බැංකුව ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ සඳහා වෙන්කර ඇති මුදල රු. මිලියන 493 කි. 10% පොලියට ණය නිකුත් කරනු ලබන අතර ලබාදෙන අවම ණය මුදල රු. 10,000 කි. උපරිමය රු. 50,000 කි. 1998 වර්ෂය තුළ නිකුත් කළ ණය සංඛ්‍යාව 6761 ක් වන අතර එහි වටිනාකම රු. මිලියන 168 කි. 1999 ජූනි මාසය වනවිට මේ යටතේ ණය 8533 ක් ලබාදී ඇති අතර එහි වටිනාකම රු. මිලියන 219 කි.

# ණය වැඩ සටහන් ප්‍රගතිය 1999-06-30 දිනට














## 4. සමෘද්ධි කල්බදු ණය වැඩසටහන

සමෘද්ධි කල්බදු ණය වැඩසටහන යටතේ සමෘද්ධි නියාමකයින් 5000 කට ණය පහසුකම් ලබාදීමට සැලසුම් කර ඇත. සීමාසහිත පීපල්ස් ලිසිං සමාගම හා ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන අතර මේ සඳහා වෙන්කර ඇති මුදල රු. මි. 300 කි. ආදායම් වර්ධනය කර ගැනීමේ පදනමක් මත කටයුතු කරන ව්‍යාපෘති සඳහා තනි පුද්ගලයකු වශයෙන් හෝ බද්ධව කණ්ඩායම් වශයෙන් ණය පහසුකම් ලබාගත හැකිවේ. තනි පුද්ගලයකුට ලබාදෙන අවම ණය මුදල රු. 75,000 වන අතර උපරිමය රු. 150,000 කි. පුද්ගල කණ්ඩායමක් සඳහා 150,000 සිට 300,000 දක්වා 10% ක පොලියට ණය පහසුකම් සපයනු ලැබේ. ණය ගෙවීමේ කාලය උපරිමය මාස 48 කි.

1998 වර්ෂයේදී විවිධ ප්‍රාග්ධන භාණ්ඩ 508 ක් මිළදී ගැනිම සඳහා රු. මිලියන 121.87 මේ යටතේ ලබා දී ඇත. 1999 ජුනි මාසය වනවිට මේ යටතේ ප්‍රාග්ධන භාණ්ඩ 588 ක් ලබාදී ඇති අතර එහි වටිනාකම රු. මි. 140 කි.

ණය වැඩසටහන් 1996 - 1999 ජුනි

වගු අංක 10

| ණය වැඩසටහන | සංඛ්‍යාව | වටිනාකම රු.මි. | නැවත අයකර ගැනීම් ප්‍රතිශතය |
|---|---|---|---|
| කඩිනම් | 110888 | 93 | 98% |
| සවණ | 8533 | 219 | 83% |
| කල්බදු | 588 | 140 | 50% |
| සසණ | 80361 | 478 | 69% |
| එකතුව | 200370 | 930 | 75% |

## විශේෂ ව්‍යාපෘති සඳහා ණය ලබාදීම

සමෘද්ධි, යෞවන කටයුතු, හා ක්‍රීඩා අමාත්‍යාංශයේ යෞවන රැකියා සැලසුම් අංශය මගින් යෞවනයන්ට විකල්ප රැකියා ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ව්‍යාපෘතිවලට අයත් සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල තරුණ, තරුණියන්ට විශේෂ ව්‍යාපෘති ලෙස සසණ හා සවණ වැඩසටහන් යටතේ රුපියල් මිලියන 42 ක පමණ මුදලක් ණය වශයෙන් නිකුත් කිරීමට කටයුතු කරඇත.

### 1. කජු පිරි සැකසුම් ව්‍යාපෘතිය

ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ක සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 3000 කට අයත් තරුණ තරුණියන්ට සසණ වැඩසටහන යටතේ රු. මිලියන 9 ක් ලබාදීමට කටයුතු කරඇත.











## 3. හාල් මැස්සන් වියලීමේ ව්‍යාපෘතිය

හලාවත සහ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 300 ට සවණ වැඩසටහන යටතේ රු. මි. 7.5 ක් ලබාදීමට කටයුතු කරඇත.

## 4. ඇගළුම් කම්හල් ව්‍යාපෘතිය

හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 560 ට නවීන පන්නයේ ඇගළුම් කම්හලක් ආරම්භ කිරීම සඳහා රු. මි. 25.3 ක ණය මුදලක් සවණ වැඩසටහන යටතේ නිකුත් කර ඇත.

# සත්ත්ව පාලන හා ධීවර සංවර්ධන වැඩසටහන

සමෘද්ධි සහනාධාරලාභීන්ගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කිරීමත් ඔවුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමත් අරමුණු කොටගෙන මෙම වැඩසටහන දියත් කොට ඇත. ඒ අනුව මෙම වැඩසටහන මඟින් සත්ත්ව පාලන, ධීවර කටයුතු හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## සත්ත්ව පාලන කටයුතු

සත්ත්ව පාලන වැඩසටහන යටතේ ගවයින්, ඌරන්, එළුවන් හා කුකුළන් ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. 1998 වර්ෂය තුළ බ්‍රොයිලර් කුකුළන් , ඌරන් හා කිරි ගවයින් ඇති කිරීමේ ව්‍යාපෘති 68 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හයක ක්‍රියාත්මක කර ඇත. 1999 වර්ෂයේ ජුනි මාසය වන විට බ්‍රොයිලර් නිෂ්පාදන, බිත්තර නිෂ්පාදනය හා කුකුල් කෑම අලෙවිය පිළිබඳව ව්‍යාපෘති 41 ක් කොට්ඨාශ 05 ක ආරම්භකර ඇත.







## ධීවර සංවර්ධන කටයුතු

ධීවර වැඩසටහන මඟින් මිරිදිය මත්ස්‍යය වගාව ප්‍රචලිත කිරීමත් , එමඟින් ස්වයං රැකියා අවස්ථා ලබාදීමත් අරමුණු කෙරේ. ඒ අනුව 1998 වර්ෂය තුළ ඇඟිල්ලන් ඇතිකිරීමේ ව්‍යාපෘති 05 ක්ද, මාළු පැටවුන් බෝකිරීමේ ව්‍යාපෘති 02 ක්ද, සුරතල් මසුන් ඇති කිරීමේ ව්‍යාපෘති 14 ක්ද , ආහාර සඳහා මසුන් ඇතිකිරීමේ ව්‍යාපෘති 09 ක්ද, මාළු අලෙවි කිරීමේ ව්‍යාපෘති 04 ක්ද ක්‍රියාත්මක කර ඇත.

1999 වර්ෂයේ ජුනි මාසය වනවිට සුරතල් මසුන් අලෙවිය සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් යොමුකර ඇති අතර සත්ත්ව පාලන හා ධීවර කටයුතු සඳහා 377 දෙනෙකු පුහුණු කර ඇත.

## පෝෂණ වැඩසටහන

ජාතික සංවර්ධන භාරකාර අරමුදලේ මූල්‍ය අනුග්‍රහය යටතේ සමෘද්ධි පෝෂණ වැඩසටහන ආරම්භ කරන ලදි. සමෘද්ධි නියාමකවරුන් හා සමෘද්ධි කළමණාකරුවන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මේ සඳහා පුහුණු කරනු ලැබ ඇත. පෝෂණ වැඩසටහන මඟින් අවු. 05 ට අඩු දරුවන්, ගැබිනි මව්වරුන් සහ කිරිදෙන මව්වරුන් ඉලක්ක කණ්ඩායම් ලෙස ගෙන ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා ආදර්ශණ පැවැත්වීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ පෝෂණ මට්ටම හා සනීපාරක්ෂාව උසස් කිරීමට ගෙවතු වගා හා සත්ත්ව පාලන ඒකක ඇති කිරීම, පානීය ජලය හා වැසිකිළි පහසුකම් ඇතිකිරීම පාරිසරික ගැටළු සඳහා විසඳුම් සෙවීම යන කරුණු ඉටු කර ඇත.

# මෙහෙයුම් හා ඇගයුම් කටයුතු







දිළිඳුකම පිටුදැකීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරන ආයතන වන දිළිඳු සහන දෙපාර්තමේන්තුව , සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ වැඩසටහන් සියල්ලක්ම ආවරණය වනසේ ග්‍රාමීය වසම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා එම වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව හඳුන්වා දී ඇති සියළුම වැඩසටහන්වල ප්‍රගතිය මැනිය හැකි දර්ශක වලට අදාල ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු පහළ සිට ඉහළට වාර්තා කරවා ගැනීමේ වැඩපිළිවෙලක් සකසා ඇත.

මෙය පිළිවෙලින් වසම් මට්ටම සිට කලාප මට්ටම, ප්‍රාදේශීය මට්ටම දිස්ත්‍රික් මට්ටම හා ජාතික මට්ටම දක්වා තොරතුරු ගලා ඒම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙලකි. එම විස්තර දැක්වෙන සටහන පිටු අංක 32 හි දැක්වේ.

ඒ අනුව සෑම මසකටම වරක් ඒ ඒ මට්ටම්වලින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම් මඟින් අදාල තොරතුරු ලබාගැනීම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු නිරාකරණය කරගැනීම හා අත්දැකීම් හුවමාරු කරගැනීම යන කටයුතු සිදුකෙරේ.

මෙයට අමතරව ඒ ඒ කලාපවල සිදුකර ඇති සංවර්ධන කටයුතුවල තත්ත්වය නිරීක්ෂණය කර වාර්තා කිරීම සඳහා විශේෂ නිලධාරි කණ්ඩායමක් පුහුණු කර ඒ සඳහා යොදවා ඇති අතර සෑම වසරකටම දෙවරක් මෙම කණ්ඩායම යොදවා සෑම කලාපයකම කටයුතු නිරීක්ෂණය කොට ප්‍රතිලාභි හා නිලධාරි අදහස්ද ලබා ගැනීම තුළින් හඳුනාගනු ලබන අඩුපාඩු සපුරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

# සමෘද්ධි වැඩසටහන් - මෙහෙයුම් ඇගයුම් ක්‍රියාවලිය

| පරිපාලන / කළමණාකරණ මට්ටම | | | සමෘද්ධි වැඩසටහන මගින් කෙරෙන මෙහෙයුම් හා ඇගයුම් ක්‍රියාවලිය | අමාත්‍යාංශය මගින් කෙරෙන මෙහෙයුම් හා ඇගයුම් ක්‍රියාවලිය | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මගින් කෙරෙන මෙහෙයුම් හා ඇගයුම් ක්‍රියාවලිය |
|---|---|---|---|---|---|
| ජාතික මට්ටම | ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය<br>සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව<br>දිළිඳු සහන දෙපාර්තමේන්තුව | | i. සමෘද්ධි අධිකාරිය / සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් සහකාර සමෘද්ධි කොමසාරිස්වරුන් මසකට වරක් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් තොරතුරු ලබාගැනීම<br>ii. සමෘද්ධි අධිකාරිය/සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තාමේන්තුව සහ දිසාපතිවරු<br>මාස 3 කට වරක් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් | i. මසකට වරක් ගරු ඇමතිතුමාගේ සහ ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති<br>සමාලෝචන රැස්වීම්<br>ii. කාර්තුමය ප්‍රගති වාර්තා සැකසීම<br>iii. වාර්ෂික ප්‍රගති වාර්තා සැකසීම | i. ත්‍රෛයිමාසික ප්‍රගති වාර්තා සැකසීම<br>ii. වාර්ෂික ප්‍රගති වාර්තා සැකසීම<br>iii. ගරු ජනාධිපතිතුමිය සමඟ පැවැත්වෙන සාකච්ඡා |
| දිස්ත්‍රික් මට්ටම | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් අධ්‍යක්ෂ | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල (සහකාර සමෘද්ධි කොමසාරිස්.) | i. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් කළමණාකරුවන් සමඟ මසකට වරක් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම්<br>ii. දිස්ත්‍රික් ලේකම්වරුන්/සහකාර කොමසාරිස්වරුන්, මූලස්ථාන කළමණාකරුවන් සමඟ මසකට වරක් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් තොරතුරු ලබාගැනීම | | |
| ප්‍රාදේශීය මට්ටම | ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය අධ්‍යක්ෂ | ප්‍රාදේශීය සමෘද්ධි ඒකකය (මූලස්ථාන කළමණාකරු) | i. ප්‍රාදේශීය ලේකම්වරුන්/මූලස්ථාන කළමණාකරුවන් සහ නියාමකවරුන් සමඟ මසකට වරක් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් | | |
| කලාප මට්ටම | කලාප කළමණාකරු | කලාප කළමණාකරු | i. කලාප කළමණාකරුවන් හා නියාමකවරුන් එක්ව සතියකට වරක් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් තොරතුරු ලබා ගැනීම<br>ii. කාර්තුවකට වරක් කලාප මට්ටමේ ප්‍රගතිය ඇගයීමේ වැඩසටහන<br>iii විශේෂ නිලධාරී කණ්ඩායමක් මගින් කලාපවල ප්‍රගතිය පරීක්ෂාකරවීම මෙම ක්ෂේත්‍ර අධ්‍යයන මගින් සොයා ගන්නා තොරතුරු ආශ්‍රිතව කලාප කළමණාකරුවන් සමඟ පැවැත්වෙන සංවාදශීලි වැඩසටහන මගින් තොරතුරු හුවමාරු කරගැනීම | | |
| | සමෘද්ධි සංවර්ධන නිලධාරී / නියාමකවරු | | | | |
| වසම් මට්ටම (සමෘද්ධි බලකාය) | | | i. නියාමකවරුන් හා කුඩා කණ්ඩායම් නායකයින් එක්ව, සතියකට වරක් කෙරෙන සාකච්ඡා මගින් තොරතුරු ලබා ගැනීම | | |
| පවුල් මට්ටම (කුඩා කණ්ඩායම්) | | | i. සමෘද්ධි ප්‍රතිලාභීන් කුඩා කණ්ඩායම්වලට එක්ව සහභාගිත්ව ක්‍රමවේදය යොදා ගනිමින් සමෘද්ධි වැඩසටහන මගින් කෙරෙන කටයුතු තුළින් තම දියුණුවට ඇති වූ දායකත්වය ඇගයීම | | |